# 5 ශ්‍රේණිය සිංහල
# ගුරු අත් පොතට
# වැඩ පොත - අංක 07

(Part ii)

**L5 S5 R5 W5**

**නිපුණතා ආවරණය - 2021**



1. වාංමාලා පෝෂණය සඳහා වචන එක්රැස් කර නිවැරදි ව භාවිත කරයි.
2. තේරවිලි විසඳීමේ දී විචාරශීලී ව පිළිතුරු සපයයි.
3. යුගල පද, ප්‍රස්තාව පිරුළු, රූඪී/ඉඟි වැකි සහ ආප්තෝපදේශ නිවැරදි අර්ථ ගැන්වීම් සඳහා භාවිත කරයි.


**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



For Online Class Details – WhatsApp 071 9020298

## රූඩී/ඉඟි වැකි

- හතර වන ශ්‍රේණියේ දී උගත් රූඩී/ඉඟි වැකි භාවිත අවස්ථාව වරහනින් තෝරා ලියන්න.

  (කිසිවක් අත නොහැර කියවීම සහ කතා කිරීම යි, යම් විපතකින් යාන්තමින් ගැලවීම යි, දැඩි සතුටකට පත් වීම යි, අධික වර්ෂාව යි. යම් කිසි කාර්යයක් අවසන් වන තුරු නොනවත්වා කිරීම යි.)

1. එක හුස්මට

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. අකුරක් නෑර

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. ඉහේ මලක් පිපුණා

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. අනූ නවයෙන් බේරුණා

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

5. මොර සූරන වැස්ස

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

- පහත සඳහන් රූඩී/ඉඟි වැකි ඇතුළත් පාඩම කියවා සුදුසු රූඩී/ඉඟි වැකිය තෝරා යා කරන්න.

### පාසල් වගා බිම

පාසල් වත්තේ පිටුපස ඇති බිම් කොටසක අපේ පන්තියේ වගා බිම සකස් කර ඇත. සෑම සඳුදාවක ම උදෑසනින් පැමිණෙන සිසුහු එහි වල් පැළ ගැලවීම, පොහොර දැමීම සහ වතුර දැමීම ආදි කටයුතු කරති.

එක් සඳුදාවක උදෑසන 6.30 වන විට පැමිණ සිටි අපි ගුරුතුමිය ද සමඟ වගා බිමට ගියෙමු.

"වෙන දාට මීට වඩා ළමයි උදෙන් ම එනවා නේ. අද මොක ද මේ ළමයි අඩු ?" යැයි ගුරුතුමිය අප දෙස බලමින් පැවසුවා ය.

"අනිත් අය දැන් එයි ටීචර්" යැයි පවිත්‍රා කිවුවා ය.

"එහෙම බැහැ නෙ දරුවනේ. පුංචි කාලෙ ඉඳල ම පුරුදු වෙන්න ඕනෑ වෙලාවට වැඩ කරන්න. ඇඟ බේරගන්න වැඩ කරලා හරි යන්නේ නැහැ. වගකීමක් පැවරුවා නම් ඒ දේ හරියට කරන්න ඕනෑ" ගුරුතුමිය කිවුවා ය.

අපේ වගාබිම පාත්ති තුනකින් සමන්විත ය. එක් පාත්තියක අමු මිරිස් ද තවත් පාත්තියක බණ්ඩක්කා ද අනෙක් පාත්තියේ වම්බටු ද වගා කර ඇත.

එදින පොහොර ගෙන ඒමට තිබුණේ කවිඳුට ය. අපි පාත්තිවල වල් පැළ ගලවමින් සිටියෙමු. කවිඳු හති දමමින් මා අසලට පැමිණියේ ය. ඪගෙන ආ බෑගය ද බිම තැබුවේ ය.

"කවිඳු මොක ද මේ බය වෙලා වගේ" මම ඔහු දෙස බලමින් විමසුවෙමි.

"මට අද පරක්කු වුණා. ටීචර් බණියි කියලා බයට ම මට හින් දාඩිය දැම්මා" කවිඳු කිවුවේ ය. මම ඔහුගේ සිත සැනසුවෙමි.

මිරිස් පාත්තියේ අමු මිරිස් පැළවල කරල් බිමට බර වී තිබෙනු දැකීම අප කාගේත් සතුටට හේතු විය.

"මේ ළමයි ගොඩක් මහන්සි වුණා නේ. ඒ නිසා තමයි පලදාව මෙහෙම ලැබුණේ" යැයි ගුරුතුමිය මිරිස් කරල් අල්ලමින් පැවසුවා ය.

"මේ ගමන ආදායමෙන් අපේ පන්තියට පොත් අල්මාරියක් ගන්න පුළුවන් නේද ටීචර්" කාව්‍යා ගුරුතුමියගෙන් විමසුවා ය.

"කාව්‍යා ඒ ටිකට අහසෙ මාලිගාත් හදලා නේ" යැයි පැවසූ ගුරුතුමිය "මේ පාර ආදායමෙන් නම් බැරි වෙයි. ඒත් අපි උත්සාහ කරමුකෝ" යැයි ද පැවසුවා ය.

කවීෂ සහ පසිඳු උස් හඬින් කතා කරනු ඇසී ගුරුතුමිය ඔවුන් සිටි බණ්ඩක්කා පාත්තිය අසලට ගියා ය.

"ටීචර්, මේ බණ්ඩක්කා කරල් තියන අත්ත පසිඳු කැඩුවා" යැයි කවීෂ කිවුවේ ය.

"මොකද පසිඳු වුණේ ? ඇත්ත කියන්න." පසිඳු කඳුළු පිරි දෙනෙතින් යුතු ව ගුරුතුමිය දෙස බැලුවා ය.

"පසිඳු පන්තියේ ඉන්න හොඳ ළමයෙක් නේ. කවරදා වත් කාට වත් අබමල් රේණුවක වත් වරදක් කරන්නේ නැහැනේ. ඔයා දන්නවා මේක කැඩුවේ කවුද කියලා." ටීචර් පසිඳුව මුරුංගා අත්තේ තබමින් කිවා ය.

"මම නෙවෙයි ටීචර් කැඩුවේ. කවීෂයි මමයි මෙතන සෙල්ලම් කළා. එතකොට මගේ අත බණ්ඩක්කා අත්තෙ වැදිල අත්ත කැඩුණා."

"හොඳයි කවීෂ, වරදක් වුණත් ඇත්ත කියන එක තමයි වැදගත්." පසිඳුගේ අවංකකමට ගුරුතුමිය ප්‍රශංසා කළා ය.

| | |
|---|---|
| 1. ඇඟ බේරා ගන්නවා | ඉතා ම කුඩා ප්‍රමාණයක් |
| 2. හීන් දාඩිය දැම්මා | රවටනු පිණිස වර්ණනා කිරීම |
| 3. අහසේ මාලිගා | ඉටු නොවන සිහින මැවීම |
| 4. අබමල් රේණුවක් | වගකීමෙන් බේරීම |
| 5. මුරුංගා අත්තේ තියනවා | දැඩි සේ බියට පත් වීම |

- වචනවල මතුපිට අර්ථයට ඉක්මවා යන අර්ථයක් ඇති යෙදුම් . . . . . . . . . . . . . . ලෙස හඳුන්වයි. හිස්තැනට ගැළපෙන වාක්‍යය කොටුව තුළින් තෝරා ලියන්න.

1. ඇඟ බේරා ගන්නවා - . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
2. හීන් දාඩිය දැම්මා - . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
3. අහසේ මාලිගා - . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
4. අබමල් රේණුවක් - . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
5. මුරුංගා අත්තේ තියනවා - . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

(ඉතා ම සුළු ප්‍රමාණයක් හෝ හැඟවීමට කියයි./ තමාට පැවරුණු වගකීමකින් බේරීමේ දී කියයි./ ඉටු නොවන සිහින මැවීමක දී කියයි./ රවටනු පිණිස අනවශ්‍ය ලෙස කරන වර්ණනාවක දී කියයි./දැඩි සේ බියට පත් වූ මොහොතක දී කියයි.)

# <u>ආප්තෝපදේශ.</u>

- පැරැන්නන් විසින් උපදේශාත්මක අර්ථයෙන් පවසන ලද කියමන් ආප්තෝපදේශ වශයෙන් හැඳින්වේ. බොහෝ විට මේවා විධාන ස්වරූපයෙන් ඉදිරිපත් කෙරේ. පහත සඳහන් ආප්තෝපදේශ ඇතුළත් පාඩම කියවා සුදුසු ආප්තෝපදේශගය තෝරා යා කරන්න.

## ඔවදන් පිළිපදිමු

සිංහල සමිතිය සැම මාසයක ම අවසාන සිකුරාදා පාසලේ ප්‍රධාන ශාලාවේ දී පැවැත්වේ. මෙවර සමිතියට මම ද කතාවක් ඉදිරිපත් කළෙමි. ඒ "ඔවදන් පිළිපැදීමේ" වටිනාකම පිළිබඳව යි.

සිසුහු නියමිත වේලාවට ප්‍රධාන ශාලාවට පැමිණියහ. ආගම සිහි කිරීමෙන් අනතුරු ව සමිතියේ කටයුතු ආරම්භ විය. සිසුන් කිහිප දෙනෙකුගේ කවි, ගී ගායනාවලින් අනතුරු ව මගේ කතා වාරය එළඹිණ.

"සභාවෙන් අවසර යි, මා මෙතනට පැමිණියේ ඔවදන් පිළිපැදීමේ අගය පිළිබඳ ව කතාවක් ඉදිරිපත් කිරීමට යි.

අපි සියලු දෙනා ම ඉගෙන ගන්නා කුඩා ළමයි. කුඩා කල සිට ම අප යහපත් දේ කිරීමට සිතා ගත යුතු යි.

පාසලේ දී උගන්වන දේ පිළිබඳ ව අවධානයෙන් සවන් දීම ඉතා වැදගත්. එදිනට නියමිත ඉගෙනීමේ කටයුතු එදින ම කිරීම ඉතා හොඳ දෙයක්. නිවසේ දී කරගෙන ඒමට දෙන වැඩ වුව ද එදින ම නිම කළ යුතු යි. එදිනට නියමිත වැඩ කටයුතු එදින ම නොකළොත් වැඩ ගොඩ ගැසෙනවා. වැඩ ගොඩ ගැසීම නිසා එක ම වැඩක් වත් නිවැරදි ව කර ගන්න බැරි වෙනවා. **අද කළ යුතු දේ හෙටට කල් නොදමන්න** කියන්නේ ඒ නිසා යි.

වැඩිහිටියන් මෙන් නොව අප, අපගේ වයසට, තරමට ගැළපෙන වැඩ කළ යුතු යි. ඉගෙනීමේ දී ද ගුරුවරුන්ගේත් දෙමව්පියන්ගේත් අවවාදවලට කීකරු විය යුතු ය. එසේ නොමැති ව අකීකරු ව අපට නොගැළපෙන වැඩ කිරීමෙන් පරිහානියට පත් වෙනවා. **ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න** යන කියමන එයට ගැළපෙන බව මට සිතෙනවා.

කුමන වැඩක් කිරීමට පෙර වුව ද අප සිතා බලා, විමසා කටයුතු කළ යුතු යි. ඉගෙන ගැනීමේ දී ද අපේ අනාගතය ගැන සිතා කටයුතු කිරීම වැදගත් වෙනවා. සුදුසු කල සුදුසු තීරණ ගත යුතු යි. එවිට අනාගතයේ දී පසුතැවීමට සිදු වන්නේ නැහැ. **පනින්න පෙර සිතා බලනු** යැයි කියන්නේ එවන් අවස්ථාවල යි.

ඉගෙන ගන්නා අපට මිතුරු ඇසුර නැති ව ම බැහැ. මිතුරන් සමඟ සමඟි ව සිටිය යුතු යි. ඔවුන් සුහද ව ඇසුරු කළ යුතු යි. යහළුවන් එකිනෙකා අතර බහින් බස් වීමේ දී ඔවුනොවුන් සමඟි වන ලෙස කටයුතු කළ යුතු ය. එකනෙකා අමනාප කරම නොකළ යුතු ය. **ඇවිළෙන ගින්නට පිදුරු දමන්න එපා** යැයි කියන්නේ ඒ නිසා යි. එසේ කළ හොත් සිදු වන්නේ අනර්ථයක් ම යි.

එමෙන් ම අප ඉගෙන ගත් දෙය සොර සතුරෙකුට වත්, කිසි දා ගන්න බැහැ. අප ළඟ ඇති උපකරණ, වස්තුව සොර සතුරන්ට ඕනෑ ම විටක ගත හැකි යි. එහෙත් අප ලබන ශිල්පය කවදා වත් සොර සතුරෙකුට ගන්න බැහැ. ඒ නිසා හොඳින් අධ්‍යාපනය ලැබූ විට රැකවරණය ලැබෙන්නේත්, මතුවට පිහිට

ලැබෙන්නේත් එයින්ම යි. උගත මනා ශිල්පය ම යි මතු රැකෙනා යනුවෙන් පවසා ඇත්තේ ඒ නිසා යි.

සොහොයුරු, සොයුරියනි, මේ ඔවදන් හොඳින් වටහා ගෙන කටයුතු කිරීමෙන් අපි ජීවිතය ජය ගන්නට අධිෂ්ඨාන කර ගනිමු.

සභාවේ ඔබ සැමට ස්තුති යි."

| | |
|---|---|
| 1. අද කළ යුතු දේ හෙටට කල් නොදමන්න. | යමක් කිරීමට පෙර සිතා බලන්න. |
| 2. ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න. | ආරවුලක් තව තවත් ඇවිස්සීමට කටයුතු නොකරන්න |
| 3. පනින්න පෙර සිතා බලනු. | උගත් ශිල්පය ම මතු ආරක්ෂාව සලසයි. |
| 4. ඇවිලෙන ගින්නට පිදුරු නොදමන්න. | අද කළ යුතු දේ අද ම කරන්න. හෙටට කල් නොදමන්න. |
| 5. උගත මනා ශිල්පය ම යි මතු රැකෙනා | ප්‍රමාණයට වඩා අහංකාර නොවන්න. |

- හිස්තැනට ගැළපෙන වාක්‍යය වරහන් තුළින් තෝරා ලියන්න.

1. අද කළ යුතු දේ හෙටට කල් නොදමන්න.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. පනින්න පෙර සිතා බලනු.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. ඇවිලෙන ගින්නට පිදුරු නොදමන්න.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

5. උගත මනා ශිල්පය ම යි මතු රැකෙනා.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

(ප්‍රමාණයට වඩා අහංකාර නොවන්න./ වැඩ කල් නොදමන්න./ යමක් කිරීමට පෙර සිතා බලන්න./ උගත් දේ සැමදා රැකෙයි./ ආරවුලක් තව තවත් ඇවිස්සීම නොකරන්න.)

## උපමා

- වගේ, මෙන්, මෙනි, සේ, ලෙසින්, පරිද්දෙන්, වැනි යන පද යොදා යම් දෙයකට හෝ යම් කෙනෙකුට හෝ යම් අවස්ථාවකට හෝ යමක් සමාන කරන්නේ නම් එය උපමාව ලෙසින් හඳුන්වයි. පහත කවි/ ගීත සහ ඡේද කියවා ඒවායේ අන්තර්ගත උපමා තෝරා ලියන්න.

### හොඳ ළමයා

පාට සුවඳ එක වගේ
තිබෙන රෝස මල වගේ
කීකරු පොඩි ළමයගේ
කවුරුත් පවසති අගේ

මව්පියන්ට ගුරුවරුන් ට
ගුණවත් වැඩි මහල්ලන් ට
කීකරු වන පොඩිත්තන් ට
පුළුවනි ලොව බබළවන් ට

### රාත්‍රිය

සමන් පිච්ච මල් ඉහිරුණු
නිල් තණකොළ පිට්ටනියක්
වගෙයි අහස අන්න බලනු
කොච්චර ලස්සන ද රෑට

බකමූණෝ පියාඹති
අතින් කුරුල්ලෝ නිදති
බෝ අතුවල එල්ලී ගෙන
මා වවුලෝ කෑගසති

පොතට පතට සිත දීම යි
හැකි තරමින් ඉගෙනීම යි
කාගෙත් සිත් පිනවීම යි
මේ ටික අපෙ පැවතීම යි

පොඩිමල් කොළ තිබෙන ගහා
සැලෙන ලෙසින් එහා මෙහා
හොඳ ළමයා නොව තරහා
අවවාදෙට නැමෙයි වහා

මල්වල සුම්හිරි පැණී
ඇඳ බොන බඹරා මෙනී
හොඳ ළමයා නුවණී නී
හොඳ දේ තෝරා ගනී

එස්. මහින්ද හිමි

මගෙ සුරතල් අක්කාගේ
මාලේ මුතු ඇට වාගේ
මේ වැටෙන්නෙ පිනි බින්දුත්
හදමු එකක් ඒ වාගේ

හඳහාමී අප දිහාව
එබී බලයි පා හිනාව
සිහිල් සුළං දැල් විදින්න
දොරට යන්න හොඳ වෙලාව

අහසේ තරු මල් පිපිලා
පොළොවේ සුදු මල් පිපිලා
මඟුල් ගෙවල් දෙකක් වගෙයි
මේ දෙපළ ම හැඩ ගැහිලා

එස්. මහින්ද හිමි

උදා : කීකරු පොඩි ළමයා - පාට සුවඳ එක වගේ තිබෙන රෝස මල වගේ.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

## කුහුඹු පෙරහැර

පුංචි කුඹි පෙළ ගැහිලා
කළු සායම් ඉරක් වගේ
කොහේ කොහේ යනව ද මේ
සුදු හුනු ගෑ බිත්ති දිගේ

මතු දිනයක් ගැන හිතලා
කන්න අහර රැස් කරලා
අනාගතය ගැන හිතන්න
අපටත් ඔය කියනවා ද ?

පොතේ අකුරු පේළි වගේ
දිගින් දිගට පෙළ ගැහිලා
රජ පෙරහැර යනව ද ඔය
කියන්න පොඩි කුඹියනේ

ගායනය : කසුන් කල්හාර
සංගීතය : තනුජා ප්‍රියන්ති බන්දුල
පද : මහින්ද අල්ගම

හිරු එනකොට ආකාසේ
රන් තරු මල් කොහි යනව ද
වලාකුළක් පොරවා ගෙන
හඳහාමිත් නිදියනව ද

ගස් අස්සෙන් තීරු තීරු
එන හිරු රැස් සාරි වගෙයි
අම්මට දෙන්නට හිතුණත්
අල්ල ගන්න බැරි ගාන යි

මල් පෙති මත මුතු පිනිකැට
අම්මට මාලෙකට හොඳයි
අහුලා ගන්න හදන කොට ම
ඒවත් කොහෙදෝ හැංගෙයි

ගායනය : තර්ෂණ මාධව පෙරේරා
සංගීතය : රෝහණ වීරසිංහ
පද : මහින්ද අල්ගම

## ගඟ අද්දර කැලේ සෝමවීර සේනානායක

පහුර ගඟ පහළට ඇදී ගියේ ය. ගඟ දෙපස ඇති උණ පඳුරුවල අගිස් ගඟට නැමී ඇත්තේ කර උස්සා අප දෙස බලා සිටින මිනිසුන් මෙනි. ඒ උණ පඳුරුවල වැසූ කොකුන්ගේ සුද පෙනෙන්නේ ඉගිළෙන විට ය. විශාල කොට්ටං ගස්වල එල්ලුණු වවුලන් නඟන හඬ චිරි චිරිස් හඬින් ඇසේ. උන් පියඹා යන්නේ හෙලිකොප්ටර් යානා පරිද්දෙනි. කදුරු, කිරල, දොඹ, ඇහැළ, හික් ආදි ගස් ගඟ දෙපස සිටින මුරකරුවන් වැන්න. ඇතැම් ගසක අත්තක් ගඟ දියෙහි ගෑවෙන්නේ ගඟ හා රහස් කොඳුරන ලෙසිනි. පස සෝදා යාම නිසා සමහර ගසක මුල් අපට පෙනෙන්නේ අඬු විහිදාගත් දැවැන්ත සතෙකු මෙනි. තවත් තැනක ඇති විශාල ගස් බෙනය කෙනෙකුට පදිංචියට තරම් වෙයි.

## මඩොල් දූව මාර්ටින් වික්‍රමසිංහ

ගසක කොළයක් පවා සොලවන තරම් සුළඟ කුදු නොහැමූ නිසා නිසන්සල වූ දිය ඇති නදිය, නිල් මිණි තලාවක් සේ බබළයි. නදියෙහි ඈත තැනින් තැන වූ ගල්කුළු අසල නවත්වන ලද ඔරුත් එහි හිඳගෙන මාළු බාන මිනිසුනුත් අපට පෙනුණේ කළු පාට සෙවණැලි ලෙසිනි. ළහිරු රැසින් බැබළෙන දිය ඇති නදියෙහි ඇතැම් තැනක් රිදී කඳක් සේ සිත් ගනියි. අතුරන ලද මාගල් පැදුරක් සේ දියකඳ වසා සිටි පෙඳ ඇතිරිල්ල උඩින් ඔරුව පැදවීම අමාරු කාරියක් විය. හබලෙහි ඇවිලීමෙන් හබලත් සමඟ දියෙන් ඉස්සෙන පෙඳ කැටිවලින් පනින කුනිස්සෝ, පොරි ඉසින්නක් මෙන් යළිත් දියෙහි වැටෙති.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

- හිස්තැනට ගැළපෙන උපමාව වරහන් තුළින් තෝරා පහත කවි සම්පූර්ණ කරන්න.

රෑ අහසේ සඳ බබළයි

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

රෑ අහසේ තරු දිදුලයි

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

අක්කාගේ සිනා මුහුණ

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

නංගීගේ සිනා කටේ

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

(රෝස මලක් සේ ම පෙනෙයි./ අම්මාගේ මුහුණ වගෙයි/ මුතු සේ දත් පෙළ දිලිසේ/ කහමල් වත්තක් වාගෙයි)

- හසිත්නට ගැළපෙන උපමාව තෝරා හසිත්නට ලියා වාක්‍ය සම්පර්ූණ කරනත්.

1. නංගීගේ සුරතල් මුහුණ

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. බැස යන හිරු

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. අපේ ගමේ වැව ඈතට පෙනෙන්නේ

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. රාත්‍රියේ පියාඹන කණාමැදිරියන්

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

5. අපේ ගම වටා විහිදී ඇති කඳු පෙළ

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

(ගම ආරක්ෂා කරන පවුරක් වැනිය/ රත් පැහැ ගැන්වුණු ගිනි බෝලයක් මෙන් දිස් වේ/ රෝස මලක් වැනි ය. / අහසේ දිදුලන තරු මෙන් පෙණුනි. / මුහුදක් ලෙසිනි.)

## <u>පුනරීක්ෂණ</u>

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. අම්මා එනතුරු (මම / අපි) බලා සිටියෙමි.
2. අපි තෙල් මල් රැගෙන පන්සල් (ගියෝය / ගියෙමු)
3. (ළමුන් / ළමයි) සෙල්ලම් කිරීමට පිටියට ගියහ.
4. කිකිළිය පසුපස පැටව් දුවගෙන (යයි / යති)

**දී ඇති වචන ඇසුරෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.**

අසල්වැසියෝ, අම්මා, මල්, පලතුරු, පොල් මුල, වත්ත, බිරිඳ, ලොකු අම්මා, සිඟිත්තිය, කොහු, පූසි පැටවා, සීයා, සායම්, පැදුරු, අකුර, ලේබිකාව, චිත්‍රය, නැන්දා, සම්මාන, තාත්තා

| ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

**ගැළපෙන අකුරු කොටුව තුළින් තෝරා ලියන්න.**

ධ , ළු , එ , භ , ප , ශ , න , ණ , ක , රැ , රු , ස

1. විභාග ප්‍රති.........ල
2. හිරු .........ස්
3. පු.........ද්ද
4. පරීක්ෂ...........